VIDUS 18-1/2-3

# පුස්තකාලයෙ

# එද සහ අද

ජ්වරී කොරයා

## එද පුස්තකාලය

ඉකුත් වසර සියයක පමණ කාලය තුළ පුස්තකාලයන්ගේ වර්ධනය ඉතා සීඝ්‍රයෙන් සිදුවී ඇත. සම්භාව්‍ය සහ මධ්‍යතන යුගයන්හිදී උගැන්ම ප්‍රධාන වශයෙන්ම සිදු වූයේ වාචිකවය. ඉගෙනීම කෙරුනේ වැඩි වශයෙන්ම පන්සල් සහ ආරාම වලය. පැවිද්දන්ද, ගිහි ලේඛකයින්ද ආරාම ආශ්‍රිත පුස්තකාලයනට සම්බන්ධව සිටි බව පෙර අපර දෙදිගම ඓතිහාසික ප්‍රවාදයන්ගෙන් පෙනී යයි. එහෙත් තවදුරටත් අතීත වාර්තා සජීවීව පවත්වා ගෙන යාමේ සාමාන්‍ය ක්‍රමය වූයේ කථාන්තර සහ කවි කතා වාචිකව නැවත නැවත කීමයි. ක්‍රි.පූ. 1 වන සියවසේදී, ශ්‍රී ලංකාවේ අළුවිහාරයේදී වට්ටගාමිණී අභය රජු සමයේදී ලේඛන ගත කරන ලද ථෙරවාදී බෞද්ධ ත්‍රිපිටකය ඒ දක්වා ආරක්ෂා වූයේ මුඛ පරම්පරාවෙනි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මයද සැලකිය යුතු කාලයක් ලේඛණගත නොවී පැවතිනි. අතීතයේදී මිනිසාගේ සමස්ථ දැනුම් සම්භාරය අන්තර්ගත වූයේ මුවින් ප්‍රකාශ වූ සම්ප්‍රදායයෙහිය.

ඉපැරණි යුගයේදී පොත්පත් වලට ගෞරව සම්මාන කරන ලද්දේය. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ හඳුන්වනු ලැබුවේ "පොත් වහන්සේ" යන පාඨයෙනි. මේවා වැඩි වශයෙන්ම දක්නට ලැබුණේ පන්සල් වලය. සාමාන්‍ය ගිහියන් අතට මේවා පත් නොවූ අතර, විනෝදයට කියවීම පිණිස පොත්පත් නොතිබිණ. පුරාතණ යුගය මුළුල්ලේම කියවීමේ හැකියාව ඇති පුද්ගලයෙකු විසින් ශ්‍රාවක පිරිසකට පොතක් හඬ නගා කියවන ලදී. ශ්‍රී ලංකාවේ, අනුරාධපුර සහ පොළොන්නරු යුගයට අයත් ග්‍රන්ථ රචනා කර ඇත්තේ ප්‍රධාන වශයෙන්ම හඬනගා කියවීමට උචිත වන පරිදිය. පොත්පත් සෑහෙන සංඛ්‍යාවක් ඇති පුස්තකාල තිබුණද, ජනතාව පුස්තකාල සැලකුයේ "හිරිහැරකාරී සන්නිවේදන මාධ්‍යයක්" වශයෙනි. මෙම ආකල්පය දීර්ඝ කාලයක් තිස්සේ පැවතිණ. එහෙත් වර්තමානයේ මෙම තත්වය මුළුමණින් වෙනස් වී ඇත. මෑතක් වන තෙක් පුස්තකාලයක් යනු උගත්, හැදියාවකින් යුත් පිරිසක් නියෝජනය වූ සංකේතයක් විය. එහෙත් මෙකල සමාජයීය සහ ආර්ථික වෙනස්කම් ඇතිවීමත් සමග, මිනිසුන් වැඩි සංඛ්‍යාවක් පුස්තකාලයක වරප්‍රසාද භුක්ති විඳි.

1 වන සියවසේදී, ශ්‍රී ලංකාවේ අළුවිහාරයේදී වට්ටගාමිණී අභය රජු සමයේදී ලේඛන ගත කරන ලද ථෙරවාදී බෞද්ධ ත්‍රිපිටකය ඒ දක්වා ආරක්ෂා වූයේ මුඛ පරම්පරාවෙනි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ධර්මයද සැලකිය යුතු කාලයක් ලේඛණගත නොවී පැවතිනි. අතීතයේදී මිනිසාගේ සමස්ථ දැනුම් සම්භාරය අන්තර්ගත වූයේ මුවින් ප්‍රකාශ වූ සම්ප්‍රදායයෙහිය.

## අද පුස්තකාලය

පුස්තකාලය නිශ්චිත ස්ථානයක පිහිටා තිබූ අවධියේ පටන් ලෝක පරිමාණ යුගය දක්වා එය ක්‍රමයෙන් විකාශනය වී ඇත. තොරතුරු විසුරුවා හැරීමෙහිලා නවීන විදුලි සංදේශ ක්‍රම වලින් වැදගත් කාර්යභාරයක් ඉටු වෙයි. මෙකල තොරතුරු කොතරම් විශාල වශයෙන් ජනනය වේද යත්, මුද්‍රිත එමෙන්ම මුද්‍රිත නොවන ප්‍රකාශන වර්ග රාශියක් ඉතා සීඝ්‍රයෙන් නිකුත් විගෙන යයි. මෙකල පර්යේෂණ සඳහාද, තොරතුරු ඒකරාශී කිරීම සඳහාද ගැණුම්කරුට පාඨකයාට තෝරාගත හැකි මනාව සංවිධානය වූ සුසංවිහිත තොරතුරු ජාල සහ දත්ත පදනම් ඇත.

## පුස්තකාල වර්ග

ඒ ඒ පාඨකයිනට සේවා සළසන පුස්තකාල වර්ග රාශියක් ඇත. එනම් ජාතික, මහජන, පාසැල්, විශ්වවිද්‍යාල සහ විශේෂ යනාදී වශයෙනි. ඒවායින් සැළසෙන සේවා සහ ඒවායේ සම්පත් හා අදල පාඨකයින්ගේ අවශ්‍යතා අතර ඍජු සම්බන්ධයක් පවතියි. පුස්තකාලයක සේවය කරන සැම කෙනෙක්ම, තම පුස්තකාලයේ නිශ්චිත අරමුණු සහ පරමාර්ථ වටහාගෙන ඒවාට මැනවින් හුරු විය යුතුය.

## ජාතික පුස්තකාලය

රටක නීත්‍යානුකූල තැන්පතු පුස්තකාලය වන ජාතික පුස්තකාලය මගින්, රටෙහි සංස්කෘතික හා සාහිත්‍යමය උරුමය සංරක්ෂණය කරනු ලබයි. ජාතික ග්‍රන්ථ නාමාවලිය සහ රටතුළ ඇති පුස්තකාලයන්හි ඇති සම්පත් පිළිබඳ ඒකාබද්ධ සූචි ඇතුළු වෙනත් නාමාවලි ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම එයට අයත්වන කාර්යයන්ගෙන් සමහරකි. රජයට සැළසුම් නිෂ්පාදකයන්ට සහ නීති සම්පාදකයින්ට තොරතුරු සැපයීමේ වගකීමද එයට පැවරී ඇත. ජාතිය සතුව ඇති මුද්‍රිත, සහ අත්පිටපත් ඇතුළු මුද්‍රිත නොවන සාහිත්‍ය සමුච්චය එමගින් අත් කරගෙන, සංවධානය කොට සංරක්ෂණය කර තබනු ලබයි. ජාතිය සතු පුස්තකාල සම්පත් සමාජයේ ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කිරීමද එහි යුතුකම වෙයි. මෙ වෘත්තිය ක්ෂෙත්‍රයට නායකත්වය සපයනු ලබන්නේ ජාතික පුස්තකාල මගිනි.

## මහජන පුස්තකාලය

සැම ජනකොටසකටම සේවය සළසන මහජන පුස්තකාලය, වෙනත් පුස්තකාලයන් ගෙන් වෙනස් වෙයි. එමගින් පාඨකයිනට අධ්‍යාපනය සහ විනෝදස්වාදය සඳහා පහසුකම් සපයමින් පුළුල්වූත්, පරිපූර්ණවූත් සේවාවක් සළසයි. ස්වෝත්සාහයෙන් අධ්‍යාපනය ලබන්නන්ට අදලවද වැදගත් කාර්යභාරයක් එමගින් ඉටු කරයි. ප්‍රජාවගේ අවිධිමත් අවශ්‍යතා සපුරාලන අතර එමගින් පාඨකයාගේ පෞද්ගලිකත්වය සුපෝෂණයටත් වැඩිදුර වර්ධනයටත් ආධාරක වෙයි.

සියළුම වයස් සීමාවන්ට අයත්, විවිධ පසුබිම් වලට, සංස්කෘතීන්ට, පන්තිවලට සහ අධ්‍යාපනික මට්ටම්වලට අයත් පුද්ගලයින් මේ සා විශාල සංඛ්‍යාවක් සහ පරාසයක් පොදුවේ එකම සේවාවක් භාවිතා කරනු වෙනත් කිසිදු පුස්තකායක දක්නට නොලැබේ. එය සැම විටම සමාජයේ ප්‍රමුඛස්ථානය දරන්නවුනට මෙන්ම කොන් වූවන්ට සේවය සළසයි. තමන් වෙත අන් අයගේ නෙත් යොමු නොවී හෝ යමක් මිලදී නොගෙන, රුඳී සිටිය හැක. එකම පොදු ස්ථානය එය වන්නේය.

## පාසල් පුස්තකාලය

පාසැලෙහි අධ්‍යාපන වැඩ සටහනට අධාර කරමින් ඒ සඳහා අත්‍යාවශ්‍ය සියළු සම්පත් සපයයි. එය ශිෂ්‍යයින් තුළ "අධ්‍යයන හැකියාවන්" සහ "විඥාපණ හැකියාවන්" නංවාලන ස්ථානයක් වෙයි.

## විශ්වවිද්‍යාල පුස්තකාලය

විශ්වවිද්‍යාලයේ කාර්යයන් සපුරාලීම සඳහා පුස්තකාලය සිය කටයුතු මෙහෙයවයි. එය උගැන්වීම සහ පර්යේෂණයට අදල සක්‍රීය බලවේගයක් වන අතර, එය විශ්වවිද්‍යාල ව්‍යුහය තුළ ශිෂ්‍යයින්ගේ සහ පීඨයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත්වන සංරචකයක් වෙයි. විශ්වවිද්‍යාලයකට ප්‍රබල පුස්තකාලයක් තිබීම අත්‍යාවශ්‍යය.

## විශේෂ පුස්තකාලය

විවිධ ආයතනයන්හි ඇති ප්‍රධානතම තොරතුරු මූලාශ්‍රය එහි පුස්තකාලයයි. මෙහිදී අවධාරණය වනුයේ අදල විෂය ක්ෂෙත්‍රයේ පර්යේෂකයින් හෝ විද්‍යාඥයින් වන එහි පාඨකයින් වෙනුවෙන් පොත්පත් එක්රැස් කිරීම සංවිධානය කිරීම සහ තොරතුරු සමුද්ධරණය කිරීම යන කටයුතුය.

## පාඨක සේවා

සමස්ථයක් වශයෙන් ගත්කල ඕනෑම පුස්තකාලයකට තම ප්‍රජාවගේ අවශ්‍යතාවනට අදාලව උසස් තත්වයේ සේවාවක් සැළසීමට හැකියාව තිබිය යුතුය. පාඨකයාට/පරිභෝග කරන්නාට/ගැණුම්කරුට ඔවුන්ගේ පුස්තකාලයට පහසුවෙන් ප්‍රවිෂ්ඨ විය හැකි මිත්‍රශීලී ලෙස සැලකිය හැකිවූත්, තම අභිලාශයන් මුදුන්පත් කර ගත හැකිවූත්, ස්ථානයක් විය යුතුය. උපදෙස් හා සහාය පහසුවෙන් ලබාගත හැකි බැව් පාඨකයාට ස්ථිර වශයෙන් දැනගැනීමට සැළැස්වීම වැදගත් වෙයි. වෘත්තීය මට්ටමේ සේවයක් සැළසීම තාක්ෂණය සඳහා මුදල් ආයෝජනය කිරීමට වඩා දුෂ්කරය. කාර්ය මණ්ඩලය තුළ සේවයට සැබෑ කැපවීමක් තිබිය යුතුය. වත්මන් යුගයේදී පුස්තකාල සේවා අලෙවිකරණය සහ ජනප්‍රිය කරවීම අත්‍යවශ්‍යයෙන් කළ යුතු කාර්ය වෙයි. මෙමෙ ප්‍රචාරක කටයුතු, ලිපි ලේඛන ජන මාධ්‍යය සහ පාඨකයා විසින් හෙළි කළ හැකිය. නවමු සහ නව්‍යතා හඳුන්වාදීමේ ආකල්පයක්ද පිරිවැය අතින් කාර්යක්ෂමව ඉලක්ක කල ක්‍රමෝපායද ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ අවශ්‍යය.

පුස්තකාල පාඨකයින්ගේ අධ්‍යයනය ඔවුන් අවශ්‍ය යයි පවසන දේ මත පමණක් නොව, අනිවාර්යයෙන්ම ඔවුන්ට සැබවින්ම් අවශ්‍ය වන දේ මත පදනම් වන බැව් අවබෝධ කරගත යුතුය. වෙනත් වචනවලින් කියතහොත් ප්‍රශ්නාවලි වලට ලැබුනාවූ පිළිතුරු හෝ හමුවීම වටා ගෙතුන ස්ථිතික අධ්‍යයනවලට පමණක් සීමා නොවී සක්‍රිය පාඨකයින්ගේ හැසිරීම් රටාව මත සැකසුන අධ්‍යයනය විය යුතුයි. තොරතුරු ප්‍රතිග්‍රහණය කිරීමේදී ඔවුනට මුහුණපෑමට සිදුවන දුෂ්කරතා හඳුනාගත යුතුය.

අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කවර සමීක්ෂණ, ප්‍රශ්නාවලි, රැස්වීම් සහ සම්මුඛ පරීක්ෂණ යොදා ගත්තද, එම තොරතුරු අරමුණු කරගත් අනුග්‍රාහකයින්ගේ ආකල්ප පිළිබඳව අහම්බෙන් ප්‍රතිග්‍රහණය කර ගන්නා තොරතුරුද ඒ හා සමානවම වැදගත් වනු ඇති බැව් මතක තබා ගැනීම සුදුසුය. මෙහිදී පාඨකයාගේ වැදගත්කම සෑම විටම අධ්‍යක්ෂ/පුස්තකාලයාධිපතිගේ මනසේ ප්‍රමුඛස්ථානයක රැඳිය යුතුය.


**පුස්තකාල පාඨකයින්ගේ අධ්‍යයනය ඔවුන් අවශ්‍ය යයි පවසන දේ මත පමණක් නොව, අනිවාර්යයෙන්ම ඔවුන්ට සැබවින්ම අවශ්‍ය වන දේ මත පදනම් වන බැව් අවබෝධ කරගත යුතුය. වෙනත් වචනවලින් කියතහොත් ප්‍රශ්නාවලි වලට ලැබුනාවූ පිළිතුරු හෝ හමුවීම වටා ගෙතුන ස්ථිතික අධ්‍යයනවලට පමණක් සීමා නොවී සක්‍රිය පාඨකයින්ගේ හැසිරීම් රටාව මත සැකසුන අධ්‍යයනය විය යුතුයි.**

පුස්තකාල භාවිත කරන්නවුන් පුස්තකාල සූචි පිරික්සීමට හෝ, පුස්තකාල කාර්ය මණ්ඩලය සමග තමන්ට වැදගත් කරුණු සාකච්ඡා කිරීමට හෝ තම දුෂ්කරතා සාකච්ඡා කිරීමට මැලිවීම ඉතා කණගාටුදායක තත්වයකි. මා විශ්වාස කරන අන්දමට තවමත් පවතින මෙමෙ මැලිකම හරලිය යුතුය. සහාය පැතීම සහ සහාය ලැබීම සාමාන්‍ය සමාජයීය ක්‍රියාවක් වන අතර, ඒ බැව් පිළිගතයුතු වන්නේය. පුස්තකාල භාවිතා කරන්නවුන් සහ කාර්ය මණ්ඩලය අතර සාකච්ඡා ඇතිවිය යුතුය. සෙවිය යුතු තොරතුරු පිළිබඳව ප්‍රශ්න ඇසීම සඳහා සුදුසු වාතාවරණයක් ඇති වන පරිදි මෙමෙ සාකච්ඡා හැකිතාක් නොවිධිමත් ස්වරූපයක් ගත යුතුය.

නවීන පුස්තකාලයක්, බාහිර ලෝකයේ සිදුවන සීඝ්‍ර වෙනස්වීම තුලින් ඇතිවන ආතතීන් අපහසුවකින් තොරව දරා ගැනීමට ප්‍රමාණවත් නව්‍යතාවයකින් යුක්ත විය යුතුය. දැන් අවධාරණය විය යුත්තේ විද්‍යුත් තොරතුරු මූලාශ්‍රයනට සහ විද්‍යුත් තොරතුරු ජාලයනට ප්‍රවිශ්ඨවීම යන කරුණුය. එබඳු පද්ධති භාවිතය, පාඨකයින්ට හඳුන්වා දිය යුතුය. තොරතුරු තාක්ෂණය පාඨකයිනට ඉදිරිපත් කර ඔවුන් තුළ තාක්ෂණික උගැන්ම ඇති කිරීමට දැන් කාලය එළඹ තිබේ. ඔවුනට තම පුස්තකාලයේ හෝ ඉන් බැහැර වෙනත් පුස්තකාලයක, නගරයක හෝ රටක ඇති තොරතුරු සොයා ගැනීමේ හැකියාව තිබිය යුතුය. ඒ සඳහා ළමයින්ට, තරුණ තරුණියනට සහ පර්යේෂකයිනට පවා මග පෙන්වීම අවශ්‍යය. තාක්ෂණ විද්‍යා ලොවෙහි තෙරතුරු පද්ධති ඉතා සීඝ්‍රයෙන් ඉදිරියට යන බැවින් තොරතුරු අධ්‍යක්ෂ හෝ පුස්තකාලයාධිපතිටද, ඉලෙක්ට්‍රොනික තැපැල් දත්ත පදනම් (E Mail Data Base) මාර්ගගත පද්ධති : යනාදිය භාවිතය පිළිබඳ පුහුණුවක් අවශ්‍ය වෙයි.

පුස්තකාලයන්හි අන්තර්ජාල වැනි ජාත්‍යන්තර පද්ධතීන්ට ප්‍රවිශ්ඨවීමේ පහසුකම් තිබීම ලෝකයේ ඕනෑම තැනක, ඕනෑම විෂයයක් පිළිබඳව ප්‍රවර්තන තොරතුරු සීඝ්‍රයෙන්

ලබා ගැනීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. මේ ආකාරයට කිසිවෙකුත් ලෝකයෙන් වෙන්ව හුදකලාවීම අවශ්‍ය නොවන්නේය. පුස්තකාල භාවිතා කරන්නවුනට, නවතම ප්‍රකාශන සහ ලිපි යනාදිය ලබාගත හැකිවන අතර. මනාව දැනුවත් වීමේ හැකියාව ලැබෙයි. මෙම ප්‍රවිෂ්ඨවීමේ දැනුම් සම්භාරය ලබා ගැනීමට හැකියාව තිබීම ඇත්තෙන්ම ඉතා අගනේය. වත්මන් යෞවන මෙම දැනුම් සම්භාරය ලබා ගැනීමේ හැකියාව ඇත්නම් ඔවුන් සැබවින්ම වඩාත් හොඳින් අනාගතයට මුහුණදීමට හැකි තත්ත්වයකට එනු ඇත. මෙසේ වීමෙන් ප්‍රීතිමත් එමෙන්ම සැහීමට පත්වූ ජාතියක් බිහිවනු ඇත. මේ සියල්ල සාර්ථකවීමට නම් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උද්‍යෝගය තිබිය යුතුය. තොරතුරු සමස්ථ වශයෙන් ඵලදායී වීමට නම්, තම සේවය ලබන්නවුන් කෙරෙහි කාර්ය මණ්ඩලයේ මිත්‍රශීලී බව සහ ඔවුනට පහසුවෙන් සමීපවීමේ හැකියාව තිබීම අත්‍යවශ්‍ය වන්නේය. තොරතුරු සුපිරි මාවත ප්‍රබල ලෙස මුල් බැසගතහොත් පොත්පත් සහ මුද්‍රිත මාධ්‍ය අහෝසිවී යාමට ඉඩ ඇත්තේය.



**පොත්පත් කියවීම දැනුමත්**
**විනෝදස්වාදයත් ලබා දෙන්නකි**